# ජාතික පශු සම්පත් ප්‍රතිපත්තිය

## ශ්‍රී ලංකාව

**නීරෝගී සහ සමෘද්ධිමත් ජාතියක් උදෙසා පශු සම්පත**

**පශු සම්පත් අංශය**

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ පශු සම්පත් උප අංශය ආහාර සුරක්ෂිතතාව, පෝෂණය, ග්‍රාමීය ජීවනෝපායන් සහ කෘෂිකාර්මික ආර්ථිකයට අගය එකතු කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ජාතික පශු සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය මගින් කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වීම, පශු සම්පත් ජාන විද්‍යාව වැඩිදියුණු කිරීම, නිෂ්පාදන යටිතල පහසුකම් ශක්තිමත් කිරීම, පෞද්ගලික අංශයේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සහ පශු සම්පත් ව්‍යාප්ති සේවා ප්‍රතිසංස්කරණය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. කෙසේ වුවත්, පසුගිය දශක දෙක තුළ, දේශගුණික විපර්යාසවල බලපෑම්, වෙළඳපල අස්ථාවරත්වය, ආහාර හිඟය, මෑතකදී හඳුනාගත් සතුන්ගෙන් මිනිසුන්ට බෝවන රෝග සහ විකාශනය වන වෙළඳ ගතිකත්වයන් ඇතුළු සැලකිය යුතු ව්‍යුහාත්මක සහ සන්දර්භීය වෙනස්කම් මගින් යාවත්කාලීන කරන ලද ප්‍රතිපත්ති රාමුවක් අවශ්‍ය වන නව අභියෝග නිර්මාණය කර ඇත.

2006 ප්‍රතිපත්තිය පිළිබඳ සමාලෝචනයකදී, ශ්‍රී ලංකාවේ පශු සම්පත් අංශයේ තිරසාර වර්ධනය සහ ඔරොත්තු දීමේ හැකියාව (resilience) තහවුරු කිරීම සඳහා විසඳිය යුතු තීරණාත්මක අඩුපාඩු කිහිපයක් හඳුනාගෙන ඇත. මෙයට පශු සම්පත් නිෂ්පාදන පද්ධතිවල සීමිත දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව (climate resilience) ඇතුළත් වේ. විශේෂයෙන්ම සත්ව ආහාර සුරක්ෂිතතාව, තාප ආතති කළමනාකරණය, ජලය ලබාගැනීමේ හැකියාව සහ ආපදා සූදානම වැනි අංශ මීට අදාළ වේ. මීට අමතරව, එක් සෞඛ්‍ය (One Health) ප්‍රවේශයන් සහ ජෛව ආරක්ෂණ රාමු සමඟ පශු සම්පත් සංවර්ධනය දුර්වල ලෙස ඒකාබද්ධ වීම මෙන්ම, පශු සම්පත් අගය දාමයන් ප්‍රමාණවත් තරම් දියුණු නොවීම සහ සොයා ගැනීමේ පද්ධති (traceability systems) ප්‍රමාණවත් නොවීම පවතී.

මෙම අංශය නූතන තාක්ෂණයන් භාවිතයට ගැනීමේ අඩු බව, ඩිජිටල්කරණය සහ නවෝත්පාදනය සීමිත වීම, සහ කුඩා පරිමාණ ගොවීන් විධිමත් වෙළඳපොළවල් වෙත සම්බන්ධ කිරීම ප්‍රමාණවත් නොවීම වැනි අභියෝගවලට ද මුහුණ දෙයි. ප්‍රමිතියෙන් තොර සත්ව ආහාර සහ අමුද්‍රව්‍ය, ප්‍රවේණි සහ අභිජනන ද්‍රව්‍ය (genetics and breeding materials) වල පවතින හිඟකම, පෞද්ගලික අංශයේ ආයෝජන ප්‍රමාණවත් නොවීම සහ ව්‍යාපාර සඳහා හිතකර පරිසරයක් නොමැතිකම යන සීමාවන් ක්ෂේත්‍රයේ සංවර්ධනය තවදුරටත් අඩාල කරයි. තවද, වත්මන් ප්‍රතිපත්ති රාමුව එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs), විකාශනය වන ගෝලීය වෙළඳ අවශ්‍යතා සහ තිරසාර ප්‍රමිතීන් සමඟ පවතින්නේ සීමිත අනුකූලතාවයකි.

මෙම අඩුපාඩු මඟහරවා ගැනීම සඳහා, කර්මාන්තයේ ප්‍රධාන පාර්ශවකරුවන්ගේ සක්‍රීය දායකත්වය ඇතිව අමාත්‍යාංශය විසින් ජාතික කිරි සංවර්ධන ප්‍රතිපත්තිය (National Dairy Development Policy) සහ ජාතික කුකුළු පාලන සංවර්ධන ප්‍රතිපත්තිය (National Poultry Development Policy) සකස් කර ඇත. යාවත්කාලීන කරන ලද ජාතික පශු සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය මඟින් සියලුම පශු සම්පත් උප අංශ තනි, පුළුල් ප්‍රතිපත්ති රාමුවකට ඒකාබද්ධ කිරීම අරමුණු කෙරේ.

මෙම ප්‍රතිපත්තිය මගින් ශ්‍රී ලංකාවේ පශු සම්පත් අංශයේ පැන නැගී ඇති අභියෝගවලට පිළියම් යෙදීම, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සහ පශු සම්පත් සංවර්ධනය ජාතික

ප්‍රමුඛතා, ජාත්‍යන්තර කැපවීම් සහ විකාශනය වන වෙළඳපල තත්ත්වයන් සමඟ පෙළගැස්වීම සඳහා පශු සම්පත් ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමේ තාර්කික පදනම, උපායමාර්ගික ප්‍රමුඛතා සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රවේශය දක්වා ඇත.

**ප්‍රතිපත්තියේ විෂය පථය සහ අදාළත්වය**

මෙම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ පශු සම්පත් අංශයේ තිරසාර සංවර්ධනය සහ කළමනාකරණය සඳහා ජාතික රාමුවක් සපයයි. මෙය දිවයින පුරා පශු සම්පත් නිෂ්පාදනය, සැකසීම, අලෙවිකරණය, පර්යේෂණ සහ සේවා සැපයීමේ නියැලී සිටින සියලුම පාර්ශවකරුවන්ට අදාළ වේ. මෙම ප්‍රතිපත්තිය රජයේ අමාත්‍යාංශ සහ ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන, පෞද්ගලික අංශයේ ක්‍රියාකාරීන්, ගොවි සංවිධාන, පර්යේෂණ සහ අධ්‍යාපන ආයතන, සංවර්ධන හවුල්කරුවන් සහ තනි පුද්ගල පශු සම්පත් නිෂ්පාදකයින් සඳහා අදාළ වේ

මෙම ප්‍රතිපත්තියේ විෂය පථය ආහාර නිෂ්පාදනයට සහ ග්‍රාමීය ජීවනෝපායන්ට දායක වන ගවයන්, මී හරකුන්, කුකුළන්, එළුවන්, බැටළුවන් සහ අනෙකුත් ගෘහාශ්‍රිත සතුන් ඇතුළු සියලුම ප්‍රධාන පශු සම්පත් උප අංශ ආවරණය කරයි. මෙමගින් පෞද්ගලික අංශය මූලික කරගත් සංවර්ධනය, වෙළඳපොළ ඉලක්ක කරගත් සහ තරඟකාරී නිෂ්පාදනය, තිරසාර සහ පරිසර හිතකාමී සංවර්ධනය, කුඩා පරිමාණ ගොවීන් සහ ග්‍රාමීය ජීවනෝපායන් සඳහා සහාය වීම, සහ විද්‍යාව හා තාක්ෂණය මත පදනම් වූ සංවර්ධනය වැනි ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කරයි.

**දැක්ම:**

ජාතික පුනරුදය සඳහා නවීකරණය වූ සහ තිරසාර පශු සම්පත් ක්ෂේත්‍රයක් ගොඩ නැගීම.

**මෙහෙවර:**

පශු සම්පත් කර්මාන්තය ශක්තිමත්, තරඟකාරී සහ තිරසාර කර්මාන්තයක් බවට පත් කිරීම සඳහා, පවතින සියලුම සම්පත් තාක්ෂණික වශයෙන් නිවැරදි, සාමාජීය-ආර්ථික වශයෙන් පිළිගත හැකි සහ පරිසර හිතකාමී අයුරින් කළමනාකරණය කිරීම සහ උපරිම ලෙස භාවිත කිරීම මඟින් සියලුම පාරිභෝගික කණ්ඩායම් වෙත දැරිය හැකි මිලකට ආරක්ෂිත සහ පෝෂ්‍යදායී පශු සම්පත් නිෂ්පාදන සැපයීම, ජාත්‍යන්තර ඉල්ලුම සපුරාලීම සහ දේශීය ආර්ථිකයට දායක වීම.

**ඉලක්ක:**

01. ඵලදායිතාව වැඩිදියුණු කිරීම, සත්ව ආහාර සම්පත් සහ ශක්තිමත් අගය දාමයන් හරහා අඛණ්ඩ ජාතික සැපයුම සහතික කිරීම සඳහා දේශීය කිරි, මස් සහ බිත්තර නිෂ්පාදනය ඉහළ නැංවීම.

02. ගොවිපළේ සිට කෑම මේසය දක්වා අගය දාම සහ සහතික කිරීමේ පද්ධති ශක්තිමත් කිරීම මගින්, ආරක්ෂිත සහ උසස් තත්ත්වයේ සත්ව නිෂ්පාදන සහතික කිරීම.

03. කාර්යක්ෂම නිෂ්පාදන පද්ධති හරහා ගොවීන්ගේ ලාභදායිත්වය ඉහළ නංවමින් පාරිභෝගිකයින් සඳහා දැරිය හැකි මිල ගණන් පවත්වා ගැනීම.

04. දේශීය ජාන සම්පත් සංරක්ෂණය, වැඩිදියුණු කිරීම සහ තිරසාර ලෙස භාවිතා කිරීම.

05. චක්‍රීය ආර්ථික ප්‍රවේශයක් සහ ඉඩම්, ජලය සහ සත්ත්ව ආහාර යන සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීම තුළින්, පාරිසරික වශයෙන් තිරසාර සහ දේශගුණයට ඔරොත්තු දෙන (Climate-Resilient) පශු සම්පත් පද්ධති ප්‍රවර්ධනය කිරීම.

06. පශු සම්පත් නිෂ්පාදනය, සැකසීම සහ අලෙවිකරණය හරහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ප්රවර්ධනය කිරීම සහ ආයෝජන වැඩි දියුණු කිරීම මගින් ක්ෂේත්‍රයේ වර්ධනය සහ තරඟකාරිත්වය ඉහළ නැංවීම.

07. ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ සහතික කිරීමේ අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කරමින් තරඟකාරී, අපනයන-නැඹුරු පශු සම්පත් නිෂ්පාදන පද්ධති සංවර්ධනය කිරීම.

**අරමුණු:**

1. ඵලදායිතාව සහ ලාභදායී ගොවිතැන වැඩිදියුණු කිරීම මගින් සතුන්ගෙන් ලබාගන්නා ආහාර සඳහා රට පුරා ප්‍රවේශ වීමේ හැකියාව වැඩි කිරීම.

2. රට තුළ නිරෝගී සත්ව ගහනයක් සහතික කිරීම සඳහා සත්ව සෞඛ්‍ය කළමනාකරණ පද්ධති වැඩිදියුණු කිරීම.

3. තිරසාර ආහාර සම්පත් සංවර්ධනය කිරීම, ආහාරවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ කාර්යක්ෂම පෝෂණ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම මගින් ආහාර සහ පෝෂණ කළමනාකරණය වැඩිදියුණු කිරීම.

4. දේශීය සහ වැඩිදියුණු කළ සත්ව ආර වල ජානමය වැඩිදියුණු කිරීම සහ සංරක්ෂණය සහ තිරසාර භාවිතය සඳහා ක්‍රමානුකූල අභිජනන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.

5. ලාභදායී සහ නවීන පශු සම්පත් කර්මාන්තයක් සහතික කිරීම සඳහා නව්‍ය සහ දියුණු තාක්ෂණයන් හරහා අගය එකතු කිරීම වැඩි දියුණු කිරීම.

6. පශු සම්පත් ක්ෂේත්‍රය පුරා දැනුවත් තීරණ ගැනීම සඳහා, තත්‍ය කාලීන (real-time) දත්ත රැස් කිරීම, විශ්ලේෂණය සහ හුවමාරු කිරීම පහසු කිරීම පිණිස, ඒකාබද්ධ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) පදනම් කරගත් සත්ව පාලන දත්ත කළමනාකරණ පද්ධති සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම.

7. ජීවනෝපාය සංවර්ධනයට සහ කර්මාන්ත තිරසාරභාවයට සහාය වීම සඳහා පශු සම්පත් නිෂ්පාදනයේ යෙදීමට කාන්තාවන් සහ තරුණයින් බල ගැන්වීම.

8. දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ පාරිභෝගික විශ්වාසය, නිෂ්පාදන හඳුනාගැනීම සහ තරඟකාරීත්වය ඉහළ නැංවීම සඳහා ශක්තිමත් නිෂ්පාදන සන්නාමකරණ උපාය මාර්ග සංවර්ධනය කිරීම සහ වෙළඳපොළ ප්‍රවේශය වැඩි දියුණු කිරීම.

9. චක්‍රීය ආර්ථික ප්‍රවේශයක් හරහා පශු සම්පත් අතුරු නිෂ්පාදන භාවිතය ප්‍රශස්ත කිරීම.

10. තිරසාර හා දේශගුණයට ඔරොත්තු දෙන පශු සම්පත් නිෂ්පාදනය සහතික කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් සහ අන්තර් ආයතනික සහයෝගීතාවය තුළින් නව්‍ය, වෙළඳපොළ මූලික කර ගත් පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.

11. පශු සම්පත් අංශයේ විකාශනය වන ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා මානව සහ යටිතල පහසුකම් ධාරිතාවන් ශක්තිමත් කිරීම.

12. ආරක්ෂිත, උසස් තත්ත්වයේ පශු සම්පත් නිෂ්පාදන අඛණ්ඩව සැපයීම පවත්වා ගෙන යන පාලන සහ නියාමන රාමුවක් සහතික කිරීම සඳහා අන්තර් ආයතනික සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම.

**උපාය මාර්ග**

**අරමුණ 1 - ඵලදායිතාව සහ ලාභදායී ගොවිතැන වැඩිදියුණු කිරීම මගින් දැරිය හැකි මිලකට සතුන්ගෙන් ලබාගන්නා ආහාර ලබා ගැනීමේ හැකියාව වැඩි කිරීම.**

1.1. දේශගුණික ඔරොත්තු දීමේ ක්‍රියාමාර්ග තුළින් ඉල්ලුමට සැහෙන පශු සම්පත් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම.
1.2. අපනයනය ඉලක්ක කරගත් දේශීය නිෂ්පාදනය දිරිමත් කිරීම
1.3. අනුග්‍රාහක මූල්‍ය ප්‍රතිපත්තියක් හරහා සෞඛ්‍ය සම්පන්න තරඟකාරීත්වයක් සහ සාධාරණ වෙළඳාමක් සඳහා සක්‍රීය ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම.
1.4. රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය දිරිමත් කිරීම.
1.5. පශු සම්පත් ව්‍යවසායන්හි තිරසාර වර්ධනයට සහාය වීම සඳහා මූල්‍ය, තාක්ෂණය, ව්‍යාප්ති සහ යටිතල පහසුකම් සඳහා සාධාරණ ප්‍රවේශයක් ලබා දීම.
1.6. පශු සම්පත් රක්ෂණ යෝජනා ක්‍රමය සංවර්ධනය සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම.

**අරමුණ 2 - රට තුළ නිරෝගී සත්ව ගහනයක් සහතික කිරීම සඳහා සත්ව සෞඛ්‍ය කළමනාකරණ පද්ධති වැඩිදියුණු කිරීම.**

2.1. බෝවන රෝග සහ සත්වයාගෙන් මිනිසාට බෝවන (zoonotic) රෝග ව්‍යාප්තිය අවම කිරීම සඳහා රෝග ආවේක්ෂණය, වැළැක්වීම සහ පාලන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම.

2.2. ජාතික හා කලාපීය මට්ටමින් රෝග විනිශ්චය සඳහා රසායනාගාර පහසුකම් සඳහා යටිතල පහසුකම් සහ මානව සම්පත් වැඩිදියුණු කිරීම.

2.3. රාජ්‍ය හා පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධ වෙමින් තත්‍ය කාලීන රෝග වාර්තාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.

2.4. දේශසීමා පාලනය සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම

2.5. එක් සෞඛ්‍ය (one health) ප්‍රවේශයක් යටතේ ඵලදායී පශු මහජන සෞඛ්‍ය සේවාවක් ක්‍රියාත්මක කිරීම.

2.6. යහපත් සත්ව පාලන පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සඳහා ගොවිපල තක්සේරු යාන්ත්‍රණ හඳුන්වා දීම.

2.7. ක්ෂුද්‍ර ජීවී නාශක ඇතුළු පශු ඖෂධ විචක්ෂණශීලීව භාවිතා කිරීම සහතික කිරීම.

**අරමුණ 3 - තිරසාර ආහාර සම්පත් සංවර්ධනය කිරීම, ආහාරවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ කාර්යක්ෂම ආහාර පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම මගින් ආහාර සහ පෝෂණ කළමනාකරණය වැඩිදියුණු කිරීම.**

3.1. පශු සම්පත් නිෂ්පාදනය සඳහා උසස් තත්ත්වයේ සහ පෝෂ්‍යදායී සත්ව ආහාර සහ ආහාර අමුද්‍රව්‍ය වසර පුරා ලබා ගැනීම සහතික කිරීම.

3.2. පශු සම්පත් සඳහා දේශීය තෘණ (pasture), පෝෂක ආහාර (fodder) සහ සාන්ද්‍ර ආහාර (concentrates) අමුද්‍රව්‍ය නිෂ්පාදනය උදෙසා පර්යේෂණාගාර පහසුකම් ඇතුළු යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

3.3. සත්ව ආහාර නිෂ්පාදනයට හිතකර වන පරිදි අදාළ ප්‍රතිපත්ති සහ රෙගුලාසි සඳහා පහසුකම් සැලසීම.

3.4. සත්ව ආහාරවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා රසායනාගාර පහසුකම් වැඩි දියුණු කිරීම.

3.5. සත්ව ආහාර නිෂ්පාදනය සඳහා යටිතල පහසුකම්, දියුණු තාක්ෂණය වැඩි දියුණු කිරීම.

**අරමුණ 4- දේශීය සහ වැඩිදියුණු කළ පශු සම්පත් ආර වල ජානමය ප්‍රගතිය සහ සංරක්ෂණය මෙන්ම තිරසාර භාවිතය උදෙසා ක්‍රමවත් අභිජනන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.**

4.1. රටට හිතකර සත්ව අභිජනන ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීම.

4.2. ජාන විද්‍යාවේ දියුණුව තුළින් පශු සම්පත් ඵලදායිතාව වැඩි කිරීම.

4.3. ඵලදායී ජාතික සත්ව අභිජනන වැඩසටහන් සඳහා යටිතල පහසුකම් ශක්තිමත් කිරීම.

4.4. ආහාර පිණිස ඇති කරනු ලබන දේශීය සත්ව ආර බාහිර සහ ස්ථානීය සංරක්ෂණය

4.5. ප්‍රජනක ආබාධ සඳහා ප්‍රතිකාර කිරීම සඳහා පහසුකම් ශක්තිමත් කිරීම.

**අරමුණ 5- ලාභදායී හා නවීන පශු සම්පත් කර්මාන්තයක් සහතික කිරීම සඳහා නව්‍ය හා උසස් තාක්ෂණයන් තුළින් අගය එකතු කිරීම වැඩි දියුණු කිරීම.**

5.1. නවීන තාක්ෂණයන් හඳුන්වා දීම මගින් අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.

5.2. ජාතික හා ජාත්‍යන්තර ඉල්ලුමට සරිලන පරිදි ආරක්ෂිත සහ ගුණාත්මක අගය එකතු කළ නිෂ්පාදනය සහතික කිරීම.

**අරමුණ 6 – පශු සම්පත් ක්ෂේත්‍රය පුරා දැනුවත් තීරණ ගැනීම සඳහා, තත්‍ය කාලීන (real-time) දත්ත රැස් කිරීම, විශ්ලේෂණය සහ හුවමාරු කිරීම පහසු කිරීම පිණිස, ඒකාබද්ධ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) පදනම් කරගත් සත්ව පාලන දත්ත කළමනාකරණ පද්ධති සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම.**

6.1. තොරතුරු තාක්ෂණය පාදක කර ගත් පශු සම්පත් දත්ත කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.

**අරමුණ 7- ජීවනෝපාය සංවර්ධනයට සහ දළ දේශීය නිෂ්පාදිතයට සහාය වීම සඳහා පශු සම්පත් නිෂ්පාදනය.**

7.1. දරිද්‍රතාවය පිටුදැකීම සහ ආර්ථික වර්ධනය සඳහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

7.2. කාන්තාවන් සහ තරුණයින් සවිබල ගැන්වීම සඳහා රජයේ සහාය සහිත වැඩසටහන

**අරමුණ 8 - දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ පාරිභෝගික විශ්වාසය, නිෂ්පාදන හඳුනාගැනීම සහ තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා ශක්තිමත් නිෂ්පාදන සන්නාමකරණ උපාය මාර්ග සංවර්ධනය කිරීම සහ වෙළඳපොළ ප්‍රවේශය වැඩි දියුණු කිරීම.**

8.1. වෙළඳපොළ ප්‍රවණතා තක්සේරු කර ප්‍රකාශයට පත් කිරීම සඳහා අන්තර් ආයතනික යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

8.2. පශු සම්පත් නිෂ්පාදන සන්නාමකරණය සඳහා යාන්ත්‍රණයක් හඳුන්වා දීම.

8.3. වෙළඳපොළ ප්‍රවේශය ලබා ගැනීම සඳහා ගොවි සමිති සහ සමුපකාර පිහිටුවීමට කුඩා පරිමාණ නිෂ්පාදකයින් දිරිමත් කිරීම.

8.4. අපනයන වෙළඳපොළ අවස්ථා සඳහා උපායමාර්ගික වෙළඳ සබඳතා සහ ද්විපාර්ශ්වික සහයෝගීතා ඇති කිරීම.

8.5. බදු සහන සහ ගැලපෙන මූල්‍ය උපකරණ සඳහා ප්‍රවේශය පහසු කිරීම.

**අරමුණ 9 - චක්‍රීය ආර්ථික ප්‍රවේශයක් හරහා පශු සම්පත් අතුරු නිෂ්පාදන භාවිතය ප්‍රශස්ත කිරීම.**

9.1. පශු සම්පත් අතුරු නිෂ්පාදන භාවිතය ප්‍රවර්ධනය කිරීම

9.2. පුනර්ජනනීය නව නිෂ්පාදන සඳහා වෙළඳපොළ ප්‍රවේශය නිර්මාණය කිරීම

**අරමුණ 10 - තිරසාර හා දේශගුණයට ඔරොත්තු දෙන පශු සම්පත් නිෂ්පාදනය සහතික කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් සහ අන්තර් ආයතනික සහයෝගීතාවය තුළින් නව්‍ය, වෙළඳපොළ මූලික කර ගත් පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.**

10.1. පශු සම්පත් පර්යේෂණ මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම සඳහා ජාතික උපදේශක කමිටුවක් පිහිටුවීම.

10.2. පශු සම්පත් පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා රාජ්‍ය-පෞද්ගලික අන්තර් ආයතනික සහයෝගීතාව ශක්තිමත් කිරීම.

10.3. පර්යේෂණ සොයාගැනීම් හෝ නිමැවුම් (deliverables) පරිශීලකයන්, පාරිභෝගිකයන් හෝ ආයෝජකයන් වෙත ව්‍යාප්ත කිරීම සඳහා ජාතික වේදිකාවක් පිහිටුවීම.

10.4. රටේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා අදාළ කර්මාන්ත පාදක කර ගත් පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.

10.5. ජාත්‍යන්තර සහයෝගීතාව වැඩි දියුණු කිරීම.

10.6. පර්යේෂණ නිමැවුම් කාර්මිකකරණය සඳහා ආයෝජන දිරිමත් කිරීම.

**අරමුණ 11 - පශු සම්පත් අංශයේ විකාශනය වන ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා මානව සහ යටිතල පහසුකම් ධාරිතාවන් ශක්තිමත් කිරීම.**

11.1. පශු සම්පත් නිෂ්පාදනය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රජයෙන් සහ බාහිර පරිත්‍යාගශීලීන්ගෙන් ප්‍රමාණවත් මූල්‍ය සහයෝගයක් ලැබීම සහතික කිරීම.

11.2. පශු සම්පත් අංශයේ සියලුම ස්ථරවල වෘත්තීය හා කුසලතා සපිරි ශ්‍රම බලකාය වැඩි දියුණු කිරීම.

**අරමුණ 12 - ආරක්ෂිත, උසස් තත්ත්වයේ පශු සම්පත් නිෂ්පාදන අඛණ්ඩව සැපයීම පවත්වා ගෙන යන පාලන සහ නියාමන රාමුවක් සහතික කිරීම සඳහා අන්තර් ආයතනික සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම.**

12.1. පශු සම්පත් ප්‍රතිපත්තිය සහ උපායමාර්ගික සැලැස්ම ස්ථාපිත කිරීම

12.2. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පශු සම්පත් ක්ෂේත්‍රය ප්‍රමුඛතා අංශයක් ලෙස සහතික කිරීම.

12.3. ගුණාත්මක හා ආරක්ෂිත පශු සම්පත් නිෂ්පාදනය සහ නිෂ්පාදන සහතික කිරීම සඳහා පවතින නියාමන රාමුව වැඩිදියුණු කිරීම.

12.4. අදාළ අංශ අතර ප්‍රතිපත්ති සහ ඒවා බලාත්මක කිරීම් යාවත්කාලීන කර අනුකූලතාව ඇති කිරීම.

12.5. පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සහ වරින් වර බලපෑම් තක්සේරු කිරීම.

**යොමුව**

1. පශු සම්පත් ප්‍රතිපත්තිය - 2006
2. කෙටුම්පත් කරන ලද කිරි නිෂ්පාදන ප්‍රතිපත්තිය - 2023
3. කෙටුම්පත් කරන ලද කුකුළු නිෂ්පාදන ප්‍රතිපත්තිය - 2024